# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
# கூட்டுறவு அபிவிருத்தி திணைக்களம்
# DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT

දුරකථනය / தொலைபேசி / Telephone: 011-2478373, 011-2478374, 011-2478376

තැ.පෙ.419, අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 02
த.பெ. இல. 419, இல. 330, யூனியன் பிளேஸ், கொழும்பு 02
P.O.Box 419, No. 330, Union Place, Colombo 02

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2478386, 011-2478377

විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail: info@coop.gov.lk, depcoopdev@gmail.com

වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.coop.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: DCD./3/2/වි/ව

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2023.01.05

චක්‍රලේඛ අංකය - වි.01/2023

සියළුම දිප ව්‍යාප්ත සමුපකාර සමිති / සංගම්වල සභාපතිවරුන් වෙත,

## ආරවුල් බේරුම්කරණයට අදාළ ගිණුම් තැබීම

1982 අංක 32 හා 1992 අංක 11 දරණ සංශෝධිත පනත් සමග කියවෙන 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ 58 වගන්තිය හා 1973 සමුපකාර සමිති රීති මාලාවේ රීති 49 අනුව ආරවුල් බේරුම්කරණය ව්‍යවස්ථාපිත කාර්යයකි. අදාළ බේරුම්කරණ ක්‍රියාවලියෙන් පසු ගිණුම් තැබීමට අදාළ නිවැරදි ක්‍රියාපටිපාටිය පිළිබඳව නිරන්තරයෙන්ම දෙපාර්තමේන්තුවෙන් විමසීම් සිදුකරන ලබන බැවින් එයට අදාළ මග පෙන්වීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව ගිණුම් තැබීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මෙයින් උපදෙස් ලබා දෙමි.

බේරුම්කරු විසින් ලබා දුන් තීන්දුව ගිණුම්ගත කිරීම.

**1.** තීන්දුව ලැබෙන විට කල්පසු වූ ගිණුම්වලට මාරු කර ඇති ණය සඳහා ගිණුම් තැබීම.

1.1 පැමිණිල්ල විසින් ඉල්ලන ලද මුළු ණය මුදල ම ගෙවන ලෙසට තීන්දුවක් ලබදීම ගිණුම්ගත කිරීම

බේරුම්කරුවන්ගේ තීන්දු ලත් ණය ගැතියෝ (හර) XXX
    කල්පසු වූ ණය ගැතියෝ ( අව ප්‍රමිත / සැක සහිත / පාඩු ) (බැර) XXX

**1.1.1** බොල් හා අඩමාන ණය සඳහා වෙන් කර ඇති වටිනාකම මාරු කිරීම ගිණුම්ගත කිරීම.

බොල් හා අඩමාණ ණය වෙන් කිරීම (හර) XXX
    බේරුම්කරුවන්ගේ තීන්දු ලත් ණය ගැතියන් සඳහා වෙන් කිරීම (බැර) XXX

1.1.2. තීන්දුව දුන් ණය සඳහාම බොල් හා අඩමාන ණය වෙන් කිරීම ගිණුම්ගත කිරීම.
( අඩුවෙන් වෙන්කර ඇතිවිට )

(තීන්දුවේ සඳහන් ණය මුදල - මෙතෙක් වෙන් කර ඇති බොල් හා අඩමාන ණය වෙන් කිරීම් = වෙන් කළ යුතු බොල් හා අඩමාන ණය )

වියදම් ගිණුම - බේරුම්කරුවන්ගේ තීන්දු ලත් ණයගැතියන් සඳහා වෙන් කිරීම (හර) XXX
    බේරුම්කරුවන්ගේ තීන්දු ලත් ණයගැතියන් සඳහා වෙන් කිරීම (බැර) XXX

1.1.3. තීන්දුවේ සඳහන් වන නඩු ගාස්තු සහ ණය පොළී ගිණුම්ගත කිරීම.

බේරුම්කරුවන්ගෙන් තීන්දු ලත් ණයගැතියෝ (හර) XXX
    බේරුම්කරුවන්ගෙන් තීන්දු ලත් ණය ගැතියන් සඳහා වෙන් කිරීම (බැර) XXX

1.1.4. තීන්දුවට අනුව අදාළ ණය ගැතියෝ විසින් මුදල් ගෙවීම ගිණුම්ගත කිරීම.
( මුදල් පදනම මත ආදායම් හඳුනාගත යුතුය. )

1. බේරුම්කරුවන්ගේ තීන්දු ලත් ණයගැතියන් විසින් ගෙවන මුදල් පහත සඳහන් කර ඇති උපදෙස්වලට අනුව පමණක් අය කර ගැනීම කළ යුතුය.
2. මේ සඳහා අදාළ ණය ගැතියන්ගේ පුද්ගලික ගිණුම් වලට අදාළ ලෙජර් පිටුවේ උඩින්ම තීන්දුවේ සඳහන් වන නඩු ගාස්තුවල සහ ණය පොළී වටිනාකම රතු පාටින් ලියා තැබිය යුතුය.

අ. ණයගැතියා ගෙවන මුදලින් පළමුවෙන්ම නඩු ගාස්තු සම්පූර්ණයෙන්ම අයකර ගෙන අවසන් කළ යුතුය.

ආ. නඩු ගාස්තු සම්පූර්ණයෙන් කපා ගැනීම අවසන් කළ පසු තවදුරටත් මුදල් ඉතිරිව ඇත්නම් පමණක් එම ඉතිරි මුදලින් ණය පොළී කපා ගැනීමට කටයුතු කළ යුතුය.

ඇ. තීන්දුවේ සඳහන් ණය පොළිය ද සම්පූර්ණයෙන්ම කපා ගැනීම අවසන් කලපසු, තීන්දුව දුන් දින සිට ණයගැතියා මුදල් ගෙවන දිනය දක්වා අයවිය යුතු ණය පොළිය ගණනය කර එම පොළිය ද කපා ගැනීම අවසන් කළ යුතුය.

ඈ. ඊට පසුව තව දුරටත් මුදල් ඉතිරිව තිබේනම් පමණක් එම මුදලින් ණය ශේෂය අය කර ගැනීමට කටයුතු කළයුතුය.

| | | |
|---|---|---|
| 1. මුදල් පොත | (හර) XXX | |
| බේරුම්කරුවන්ගෙන් තීන්දු ලත් ණයගැතියෝ | | (බැර) XXX |
| 11. බේරුම්කරුවන්ගේ තීන්දු ලත් ණයගැතියන් සඳහා වෙන් කිරීම | (හර) XXX | |
| ආදායම් ගිණුම - බේරුම්කරුවන්ගෙන් තීන්දු ලත් ණයගැතියන් | | (බැර) XXX |

1.2 පැමිණිල්ල විසින් ඉල්ලා සිටි මුදලින් කොටසක් කපා හැර තීන්දුව ලබා දීම.

| | | |
|---|---|---|
| බේරුම්කරුවන්ගේ තීන්දු ලත් ණයගැතියෝ | (හර) XXX | |
| (තීන්දු කර ඇති ණය වටිනාකමින්) | | |
| වියදම් ගිණුම - කල්පසු වූ ණයගැතියෝ | (හර) XXX | |
| (බේරුම්කරු කපා හරින ලද ණය වටිනාකමින්) | | |
| කල්පසු වූ ණයගැතියෝ (අවප්‍රමිත/සැක සහිත/පාඩු) | | (බැර) XXX |
| (පොත්පත්වල සඳහන් වන ණයගැතියාගේ මුළු වටිනාකමින්) | | |

**1.2.1. තීන්දුව දුන් මුදල ඉක්මවා බොල් හා අඩමාන ණය වෙන් කිරීමක් කර ඇති විට ගිණුම් තැබීම.**

(තීන්දුවේ සඳහන් ණය මුදල - මෙතෙක් වෙන්කර ඇති බොල් හා අඩමාන ණය වෙන්කිරීම් ප්‍රමාණය = වැඩිපුර වෙන්කර ඇති බොල් හා අඩමාන ණය ප්‍රමාණය)

| | | |
|---|---|---|
| (I) බොල් හා අඩමාන ණය වෙන්කිරීම් | (හර) XXX | |
| ආදායම් ගිණුම - බොල් හා අඩමාණ ණය අධි වෙන්කිරීම | | (බැර) XXX |
| (වැඩිපුර වෙන්කර ඇති බොල් හා අඩමාන ණය ඉවත් කිරීම) | | |
| (II) බොල් හා අඩමාන ණය වෙන්කිරීම | (හර) XXX | |
| බේරුම්කරුවන්ගේ තීන්දු ලත් ණයගැතියන් සඳහා වෙන් කිරීම | | (බැර) XXX |

1.2.2. තීන්දුව දුන් ණය මුදලට වඩා අඩුවෙන් බොල් හා අඩමාන ණය වෙන් කර ඇති විට ගිණුම් තැබීම.

(තීන්දුවේ සඳහන් ණය මුදල - මෙතෙක් වෙන්කර ඇති බොල් හා අඩමාන ණය වෙන් කිරීමේ ප්‍රමාණය = තවදුරටත් වෙන්කළ යුතු අඩමාන ණය වෙන් කිරීම)

(I) බොල් හා අඩමාන ණය වෙන් කිරීම (හර) XXX

බේරුම්කරුවන්ගේ තීන්දු ලත් ණයගැතියන් සඳහා වෙන් කිරීම් (බැර) XXX

(II) වියදම් ගිණුම - බේරුම්කරුවන්ගේ තීන්දු ලත් ණයගැතියෝ සඳහා වෙන්කිරීම් (හර)XXX

බේරුම්කරුවන්ගේ තීන්දු ලත් ණයගැතියන් සඳහා වෙන් කිරීම් (බැර) XXX

1.2.3. තීන්දුවේ සඳහන් වන නඩු ගාස්තු සහ ණය පොළී ගිණුම්ගත කිරීම.

(1.1.3.ඡෙදයට අනුව ගිණුම් තැබිය යුතුය.)

1.2.4. තීන්දුවට අනුව අදාළ ණය ගැතියන් විසින් මුදල් ගෙවීම ගිණුම්ගත කිරීම.

(මුදල් පදනම මත අදායම හඳුනා ගත යුතුයි.)

(1.1.4.ඡෙදයට අනුව ගිණුම් තැබිය යුතුය.)

**2.** තීන්දුව ලැබෙන විට කල්පසු වූ ගිණුම්වලට මාරු කර නොමැති ණය සඳහා ගිණුම් තැබීම.

**2.1** පැමිණිල්ල විසින් ඉල්ලන ලද මුළු ණය මුදල ම ගෙවන ලෙසට තීන්දුවක් ලබා දීම ගිණුම්ගත කිරීම.

බේරුම්කරුවන්ගේ තීන්දු ලත් ණයගැතියෝ (හර) XXX

ණයගැතියෝ (බැර) XXX

**2.1.1.** බොල් හා අඩමාන ණය වෙන්කිරීම් ගිණුම්ගත කිරීම.

(තීන්දුවේ සඳහන් ණය ගැති වටිනාකමින් 100% ක්)

වියදම් ගිණුම් - බේරුම්කරුවන්ගේ තීන්දුව ලත් ණයගැතියන් සඳහා වෙන්කිරීම් (හර) XXX

බේරුම්කරුවන්ගේ තීන්දු ලත් ණයගැතියන් සඳහා වෙන්කිරීම් (බැර) XXX

**2.1.2.** තීන්දුවේ සඳහන් වන නඩු ගාස්තු සහ ණය පොළී ගිණුම්ගත කිරීම.

(1.1.3.ඡෙදයට අනුව ගිණුම් තැබිය යුතුයි.)

**2.1.3** තීන්දුවට අනුව අදාළ ණය ගැතියෝ විසින් මුදල් ගෙවීම ගිණුම්ගත කිරීම.

(1.1.4.ඡෙදයට අනුව ගිණුම් තැබිය යුතුයි.)

2.2. පැමිණිල්ල විසින් ඉල්ලා සිටි මුදලින් කොටසක් කපා හැර තීන්දුවක් ලබා දීම ගිණුම් ගත කිරීම.

| | | |
|---|---|---|
| බේරුම්කරුවන්ගේ තීන්දු ලත් ණය ගැතියෝ | (හර) XXX | |
| (තීන්දු කර ඇති ණය වටිනාකමින් ) | | |
| වියදම් ගිණුම - ණයගැතියෝ | (හර) XXX | |
| (බේරුම්කරු කපා හරිනලද ණය වටිනාකමින්) | | |
| ණය ගැතියෝ | | (බැර) XXX |
| (පොත් පත්වල සඳහන් වන ණය ගැතියන්ගේ මුළු වටිනාකමින්) | | |

2.2.1. තීන්දුවේ සඳහන් වන නඩු ගාස්තු සහ ණය පොළී ගිණුම්ගත කිරීම.

(1.1.3.ඡේදයට අනුව ගිණුම් තැබිය යුතුය.)

2.2.2. තීන්දුවට අනුව අදාළ ණය ගැතියන් විසින් මුදල් ගෙවීම ගිණුම්ගත කිරීම.

(1.1.4.ඡේදයට අනුව ගිණුම් තැබිය යුතුය.)

ඩී. ජීවනාදන්

සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ

සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්

පිටපත්

1. සියළුම මාණ්ඩලික නිලධාරින් - කරු. දැ.ගැ.පි. සහ අ.ක.ස.
2. සියළුම ක්ෂේත්‍ර නිලධාරින් - කරු. දැ.ගැ.පි. සහ සමිතිවලට අදාළ උපදෙස් ලබාදීම සහ මගපෙන්වීම් සඳහා